

# දුම්බර කරාබු

කෙන්ගල්ලේ ආර්. සුගතදස මහතා

''අපි පුංචි කාලේ කැලේට වැවෙනවාය කියල සාදික්කා ගස් බොහෝ දෙනෙක් කපල දැම්මා. ඒත් ඉතුරු වෙච්ච ගස්වල වසාවාසි, කරාබු, වෙළෙන්දන්ට විකුණල සෑහෙන මුදලක් ලැබුවා.''

කරාබු, වසාවාසිවල මිළ පෙරළියක් වෙන්න පටන් ගත්තේ 1966 විතර. ඒ කාලේ ඉඳලා දුම්බර කප්රුක කරාබු ගස යි. දුම්බර අපේ කොයි කාටත් අත මිට හයිය ලැබුනේ කරාබු වලින්. දැන් නම් කෝපි ගම්මිරිස්, කොකෝ, වලින් ගොවියාටත් හොඳ මිළ ගණන්. මේ නිසා හැම කෙනෙක්ම දැන් මේවා වවන්න උනන්දු වෙනවා. කොහොම උනත් රටට මේක ලොකුසෙතක්, බව නම් මගේ අත්දැකීමෙන් කියන්නට පුළුවන්.''

මෙසේ පැවසුවේ, දුම්බර මිටියාවතේ ප්‍රධාන පෙලේ කරාබු ගොවියෙකු වූ කෙන්ගල්ලේ ආර්. සුගතදස මහතායි. දැන් ඔහුට අවුරුදු 76 ක් විතර වෙනවා. වයසට ගියාට ගහක් කොළයක් හදන්න තියෙන උනන්දුවේ නම් අඩුවක් පෙනෙන්න නැහැ. ඔහු ගේ නිවස පිහිටි අක්කර හතරක පමණ ඉඩමේ පුළු පුළුවන් හැම අහලකම කරාබු, සාදික්කා, ගම්මිරිස් පැල ඉන්දවලා.

මෙහෙම පැල ගහ සැරයට හිටවපුවාම ගස්වල වැඩීම බාල වෙලා, පල දරන්න කල් යනවා නොවේ දැයි අප සමඟ ගිය සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරි මහතකු සුගතදස මහතාගෙන් විමසුවා. ඒකට සුගතදස මහතා එක පාරටම උත්තර දුන්නේ නැහැ. ටිකක් කල්පනා කරලා කිව්වා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ මහත් වරු වත්ත පරික්ෂා කරලා ඔය සම්බන්ධව මීට ඉහතදීත් උපදෙස් දුන්නා. ඒත් අපට පුරුදු වෙලා තියෙන්නේ ඔය විදියට පැල ඉන්දවන්නයි. පැල වෙ‍ෙගන එන පැලයක් කපන්න තවම හිත් දෙන්නේ නැහැ. ඔය ලැබෙන තරමින් පල ප්‍රයෝජනයක් ලබා ගන්නවා යනුවෙනුයි.

රටේ කොයි කාගේත් කරාබු, සාදික්කා, ගම්මිරිස් වගාවට නෙත් හිත් යොමු වෙලා තියෙන මේ අවදියේ පැලෑටි, බීජ, විශාල ප්‍රමාණයක් සඳහා දැන් ඉල්ලුමක් පවතිනවා. මේ ඉල්ලුම සපුරා ලන්නට රජයේ දෙපාර්ත මේන්තුවලට පමණක් පුළුවන් කමක් නැහැ. එම නිසා සුගතදස මහතා බඳු සැහෙන සුළු අපනයන බෝග වගාවන්වල හිමි කාරයන් ගෙන් ඒ ඒ ප්‍රදේශ වාසීනට උවමනා කරන පැල හා බීජ ලබා දීමට අදහස් කර තිබෙ නවා. සුගතදස මහතාට පැල තවානක් පිහිටුවීමට තිබුණ ප්‍රධාන බාධාව වූයේ වතුර ලබා ගැනීමේ අපහසුවයි. මේ පලාතට ඉඩෝර කාලයේ දී පැලවලට වතුර සැපයි මේ ප්‍රශ්නයක් උද්ගත වන නිසා දෙපාර්ත මේන්තුව ඒ සඳහා අවසර පත් නිකුත් කරන්නේ අවශ්‍ය පමණට ජල පහසුව ඇත්තම් පමණයි. දැන් සුගතදස මහතා විශාල මුදලක් වියදම් කර ළිඳක් කපා ගෙන තිබෙන බැවින් පැල තවානක් පිහිටු වීමට ඉතාම උනන්දුවෙන් බලාපොරොත්තු වෙනවා. කෙසේ උනත් මේ සම්බන්ධව මතු වන නොයෙකුත් ප්‍රශ්න තමන් අධෛර්‍ය මත් කරන බව සුගතදස මහතා සඳහන් කළා. වරක් සාදික්කා බීජ ඇට 10,000 ක් සැපයීමට ඇණවුමක් ලද නමුත් ඒවා ලබා ගැනීමට මහත්වරුන් පැමිණියේ නැති නිසා එකතු කළ ඇට අපතේ ගිය බව ඔහු සඳ හන් කලේ දැඩිහිත් වේදනාවකින්.

දැන් හොඳ තත්වයේ කරාබු රාත්තලක් මෙහි දී රු. 85.00 කට පමණත්, ගම්මිරිස් බුසලක් රු. 700 සිට 800 දක්වා මුදලකට ද විකුණා ගන්න පුළුවනි. කරාබු ගස්වල පලදාව හැම අවුරුද්දකම එක වගේ නැහැ. සමහර අවුරුදුවලට හොඳටම අඩු යි. ගම් මිරිස් වලින් නම් හැම අවුරුද්දෙම එක වගේ ස්ථිර ආදායමක් ලැබෙනවා. 1978 දි සුගතදස මහතා මෙම ඉඩමෙනුත් අනෙකුත් ඉඩම්වලිනුත් ලබා ගත් ගම්මිරිස් බුසල් 40ක් පමණ විකුණා තිබෙනවා.

මේ මිළ ගණන් සම්බන්ධව සුගතදස මහතා සඳහන් කලේ මෙහෙම යි. ''මේ පළාතේ කවුරුත් කරාබු ගම්මිරිස් විකුණා ගන්නේ මැණික්හින්න නගරයේ කාලයක් තිස්සේ මෙම වෙළඳාමේ නියුතු වෙළෙන් දෙකුටම යි මේ නිසා නියම මිලට ලැබෙනවා ද කියන එක අඩමානයි. පළාතේ ගොවීන්ට කොළඹ මිළ මොකක් ද යන්න දැන ගැනී මට ක්‍රමයක් නැහැ. අපේ නිෂ්පාදන එකතු කරලා කෙලින් ම කොළඹ යවලා ගන්න ක්‍රමයක් තියෙනවා නම් මේ පළාත්වලට බොහොම පළ ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවනි.''

කරාබු, ගම්මිරිස් වගාවෙන් යමක් කමක් හරි හම්බ කර ගත් පළමු පරම්පරාවේ ගොවියෙක් හැටියට සුගතදස මහතාට හැඳින් වීමට පුළුවන් උනත් ඔහු ඉතාම නිහඬ ජීවිතයක් ගත කරන කෙනෙක්. දැන් වගා කටයුතු ක්‍රම ක්‍රමයෙන් තම දරුවන්ට පවරා තිබෙනවා.



වත්තේගම ජී. බී. තේනුවර මහතා සහ මහත්මිය

# සහනාධාරෙන් කලඑළි බහින ඉඩම්

සුළු අපනයන බෝග සහනාධාර ක්‍රමවල පළ ප්‍රයෝජන ලබා ගත යුතු ගොවීන් විශාල සංඛ්‍යාවක් සිටියත් ඒ ගැන උනන්දුවක් දක්වා අවශ්‍ය කටයුතු ඉටු කර පල ප්‍රයෝජනයක් ලබා ගන්නේ ගොවීන් සුළු සංඛ්‍යාවක් විතරයි. වත්තේගම, උඩුරාවණ, ජී. බී. තේනුවර මහතා සහනාධාර තමන් ළඟට එනකම් සිටියේ නැහැ. ඔහු දන්නා කියන අයගෙන් අසා පේරාදෙණියේ, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට ගිහින් එහි ආධාර උපදෙස් ලබා ගෙන කටයුතු කර ගෙන යනවා.

තේනුවර මහතා විශාල ඉඩම් හිමියෙක් නොවෙයි. ඔහු සතු මුළු ඉඩම් ප්‍රමාණය කුඹුරු අක්කර 1/4 හා ගොඩ ඉඩම් අක්කර 1 1/4 ක් පමණකි. නමුත් සතු ඉඩම් කැබැල්ලෙන් වැඩි පල ප්‍රයෝජනයක් ගැනීම අරමුණු කිරීම නිසා මුකලන්ව තිබුණ අක්කරයක ගොඩ ඉඩම දැන් සරු සාර කොකෝ වගාවක්. මේ කොකෝ වගාව යොදලා දැන් අවුරුදු හතරක් පහක් පමණ වෙනවා ඒ අහල පහළ ඒ තරම් සරුවට වැඩුණ කොකෝ ඉඩමක් නැති තරම්. මේ නිසා අවට අයත් දැන් තමන් ගේ ඉඩම් වලට සහනාධාර ලබා ගෙන කොකෝ වගා කරන්නට කටයුතු ආරම්භ කර තිබෙනවා.

මුල දී කොකෝ වගාව ගැන කිසිම දැනුමක් තේරුමක් තේනුවර මහතාට තිබුනේ නැහැ. නමුත් සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් සමඟ නිතර කටයුතු කිරීමට සිදු වීමත් ඔවුන් ඉඩමට පැමිණීමත් නිසා ඔවුන් ගේ උපදෙස් අනුව වැඩි දියුණු

වර්ග, පැල පරතරය, අන්තර් බෝග වගාව, පස සංරක්ෂණය, පෝර යෙදීම, රෝග මර්ධනය හා වගා කටයුතු ගැන ඉතා හොඳ දැනීමක් දැන් ඔහු සතුව තිබෙනවා. තේනුවර මහතා මේ හැම එකක්ම ගැනම සුළු අප නයන බෝග සංවර්ධන වැඩ සටහනට ස්තුතිවන්ත වෙනවා. ඒ විතරක් නොවෙයි සහනාධාර ක්‍රමය යටතේ තේනුවර මහතා දැනටමත් වාරික හතරකින් රු. 900.00ක මුදලක් මේ ඉඩම සංවර්ධනය කර ගන්නට ලබා ගෙන තිබෙනවා. තවත් වාරික දෙකක මුදලක් ඉදිරි කාලයේ දී ඔහුට ලබා ගැනීමට හැකියාව තිබෙනවා.

කොකෝ වගාවේ පැල වැවී ගෙන එන කාලයේ ඊට සෙවනට ඔහු හිටවා තිබුනේ ග්ලිරිසීඩියා කෝටුයි. දැන් එම ග්ලිරිසීඩියා හොඳින් වැඩී තිබෙනවා. ඒවාහි කලින් කලට අතු කප්පාදු කර පෝරට යොදන අතර ළඟදී ම හොඳ වර්ගයේ ගම්මිරිස් පැල මෙම ග්ලිරිසීඩියා අතුවලට යවන්නට අදහස් කර ගෙන තිබෙනවා. මේ මගින් කොකෝවලට අමතරව තවත් අතිරේක ආදයමක් ගම්මිරිස්වලින් ලබා ගැනීම ඔහු ගේ අදහස යි.

# සුළු අපනයන බෝග වැවීමට ජලසම්පාදනය

මැනක් වනතුරු කෝපි, ගම්මිරිස්, කරාබු, විශාල වශයෙන් වැවුවේ හොඳ වර්ෂාපතන යක් තිබෙන කඳුරට පළාත්වල යි. කෙසේ උනත් රටේ ඉඩම් වලින් වැඩි වන ජන ගහණයට උපරිම පල ප්‍රයෝජනයක් ලබා දීමත්, රැකී රක්ෂා සුලභ කිරීමත් උදෙසා පොල් ඉඩම්වල අන්තර් වගාවන් වැවීමේ වැඩ පිළිවෙළ දැන් ඉතා උනන්දුවෙන් කර ගෙන යනවා. කුලියාපිටියේ මේවායේ වැඩ පිළිවෙළක් ඉතා ප්‍රබල අන්දමින් දියත් කර තිබෙන එක පලාතක්.

සුනිල් ජයසිංහ වගා කටයුතුවල නිරත වන තරුණයෙක්. ඔහු ඉගෙන ගත්තේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ ය. ඒ කාලේ ඔහු ගේ එකම බලාපොරොත්තුව තිබුනේ විශ්ව විද්‍යාලයට යන්නයි. විශ්ව විද්‍යාලයට ගිහිල්ලා උපාධියක් ලබා ගෙන රැකියාවකට යන්නයි. උසස් පෙළ විභාග යෙන් විෂයයන් හතරක් ම සමත් උනත් විශ්ව විද්‍යාලයට තේරුනේ නැහැ. ටික දවසක් යන කම් කණගාටුව තිබුණා. ඊළඟට සුනිල් කෙලින්ම ගොවිතැනට බැස්සා.

ඔහුට දෙමව්පියන් ගෙන් අක්කර හතරක් විතර ඉඩමක් ලැබුණා. පොල් වගා කර ඇති ඉඩමක්. මෙතෙක් කල් ඒ ඉඩමින් කර තිබුනේ මාස දෙකකට සැරයක් පොල් ටිකක් කඩා ගන්න එක විතරයි. ඒ දවස් වල පොල් අහුලා ගන්න වල් පඳුරු ටිකක් කපලා දම්මා මීසක් ඉඩකමට වෙන සාත්තු වක් කලේ නැහැ. සුනිල් වැවීම පටන් ගත්තට පස්සේ පොල් ගස් ගැන ඔහු එත රම් උනන්දුවක් තිබුනේ නැහැ. කොහොම උනත් ඔහු පිපිඤ්ඤා, කැකිරි, බටු, වැට කොළු වගේ එලවළු වගාවට ප්‍රදේශයේම ඉන්න දක්ෂ ගොවියෙක්. ඒ උනත් වගාවෙන් සැහෙන ආදයමක් ස්ථිරව ලබා ගන්න බැරිව සිටියේ ඉඩෝරය නිසා යි. මේක සුනිල් විතරක් නොවෙයි පලාතේ ගොවීන් කොයි කාටත් බලපාන ප්‍රශ්නයක්.

මේ තත්වය ලොකු වෙනසක් ඇති කිරීමට කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය පසුගිය අවු රුද්දේ පටන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා. එම අධිකාරිය ආසනය තුළ ක්‍රියාත්මක කළ විවිධ වැඩ සටහන් ගණනාවක් තිබෙනවා. එකක් තමයි පොල් ඉඩම් යටතේ කෝපි ගම්මිරිස් වගාව දිරි ගැන්වීම මෙතෙන්දී ඒ අයට තම අරමුණු ඉටුකරගැනීමට ලොකුම බාධාව ඉඩෝරයයි. විශේෂයෙන් කුලියාපිටිය අන්තර් කලාපයේ පිහිටි ප්‍රදේශයක් නිසා වැස්ස ගැන එතරම් බලාපොරොත්තුවක් තබා ගන්නට බැහැ. කොහොම උනත් පොළව යට ඕනෑ තරම් වතුර තිබෙනවා. අධිකාරියෙහි මෙහෙය

වීමෙන් දැන් ලංකා බැංකුව ණය ක්‍රමයක් මගින් ගොවීන්ට වතුර පොම්ප ලබා දීමට කටයුතු කර ගෙන යනවා. දැනටමත් පලාත්වාසීන් 300 කට මේ අන්දමේ විශේෂ වට්ටම් ඇතිව වතුර පොම්පලබා දීතිබෙනවා. මේ විදියට වතුර පොම්පයකුත්, ඇල්කතීන් නලත් ලබා ගත් තරුණ ගොවියෙක් සුනිල් ජයසිංහ මහතා.

සංවර්ධන කටයුතු සුනිල් ජයසිංහ මහතා අප සමග විස්තරයක් කලේ මෙසේ යි, "මේ අළුත් වැඩ පිළිවෙල ගැන මට කිසිම දැනීමක් තිබුනේ නැහැ. කලින් දවසක් වගා නිලධාරි මහතා ඔහුගේ උවමනාවෙන් ම හමුවීමට ඇවිල්ලා වගා කටයුතු ගැන විපරම් කලා. එහෙදි ඔහු මේ අළුත් ණය ක්‍රමය යටතේ වතුර පොම්පයක් ලබා ගැනීමට කටයුතු නොක රන්නේ ඇයි කියලා විමසුවා. එපමණක් නොවෙයි, ඔහු ආසනයේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ කළමනාකරු මුණ ගැසීමටද එක් කර ගෙන ගියා. දැන් මේ තිබෙන සිග්මා වතුර පොම්ප ලබා ගත්තේ ඒ නිලධාරීන්ගේ උනන් දුව නිසා යි."

"මේ නිසා දැන් මට එලවළු වගාව පුළුල් කර ගන්න පුළුවන් වෙනවා විතරක් නොවෙයි පෙළ් ඉඩමින් උපරිම ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වන විධියට කෝපි, ගම්මිරිස්, හැම දිනම වවන්න මා අදහස් කර තිබෙනවා. ඒවා වද වතුර යෙද විය හැකි නිසා විශේෂයෙන් පැල වැඩෙන කාලයේ දුර්භික්ෂයෙන් වන හානි වලක්වා ගන්න පුළුවනි. මේ කටයුතු ආරම්භ කරන්න මම දැනටමත් අවුරුද්ද පුරාම වතුර ගන්න පුළුවන් පතහක් කපා තිබෙනවා. වැඩි දවසක් යන්නට පෙර මගේ ආදායම 4, 5 ගුණයකින් වැඩි කරන්න පුළුවන්. ආදායම ගැන බලන කොට නම් විශ්ව විද්‍යාලයට නොයාම ගැන මා කණගාටු වන්නේ නැහැ."



කුලියාපිටියේ සුනිල් ජයසිංහ මහතා

# මල් කිනිත්තකින් දවසේ වියදම



මාජී පීරිස් මිය

උඩවැඩියා මල් වර්ගවලට ලෝක වෙළඳ පොලේ ඉල්ලුම විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. මල් 12-13 ඇති කිනිත්තකට දැන් රු. 12.50 ක පමණ මුදලක් මල් වවන්නකුට ලබා ගන්නට පුළුවන්.

මේ තත්වයේ උපරිම ප්‍රයෝජනයක් රටට ලබා ගන්නට නොයෙක් සමිති සමාගම් දැන් උත්සුක වී කටයුතු කර ගෙනයනවා. ඉන් එකක් ලංකා දුම්කොළ සමාගම. එම සමාගම උඩවැඩියා මල් වවන්නට පහසුකම් ඇති අය ඊට සම්බන්ධ කර ගැනීමට දැන් කටයුතු කර ගෙන යනවා.

මෙම සමාගම දැනට කුලියාපිටියේ උඩ වැඩියා මල්වැවීම ව්‍යාප්ත කර ගෙන යන අතර ඊට සම්බන්ධ වූ ගෘහණියක්, නාකද පොල මාජී පීරිස් මහත්මිය. ඇගේ පුතුන් තිදෙනාත්, දුවත් කොළඹ විද්‍යාලවල නේවාසිකව ඉගෙන ගන්නවා. මහත්මයා කොළඹ සමාගමක වැඩ කිරීම සඳහා දින පතා යනවා. මේ නිසා ඇයට ඇති අමතර කාලය ගත කලේ කාන්සියෙනුයි. මේ අතරයි, ලංකා දුම්කොළ සමාගමේ උඩවැඩියා මල් ව්‍යාපාරයට ඇය සම්බන්ධ වීමට හැකි වුනේ. දැන් ඇගේ කාලය ප්‍රයෝජනවත් දෙයකට යෙදීමට හැකිවීම ගැන ඇය සතුටු වනවා.


ලංකා දුම්කොල සමාගමේ ව්‍යාප්ති කට යුතුවල සහාය ඇයට නොමදව ලැබී තිබෙ නවා. එපමණක් නොවෙයි, පැලෑටි ද්‍රව්‍ය, අනිකුත් ද්‍රව්‍යමය ආධාරයන්ද ඉන් ඇය ලබා ඇත. පැලෑටිවලට සුදුසු වාතාවරණයක් සැපයීමේ දී උෂ්ණත්වය හා තෙතමනය පාලනය, හිරු එළිය ලැබිය යුතු ප්‍රමාණය, දියර පෝර යෙදීම, දිලීර නාශක යෙදීම කරුණු සම්බන්ධයෙන්ද ඇයට මනා දැනී මක් ලැබී ඇත.

සමාගමෙන් ඇයට ලැබී තිබෙන ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම රු. 3,000 ක් විතර. දැනට විනෝදාංශයක් වශයෙන් කර ගෙන යන මේ මල් ව්‍යාපාරයෙන් ඇය මසකට උයන මුදල රු. 300 ක් විතර උපයනවා.

# බුලත් වැවීමෙන් අතිරේක ආදායමක්

ගෙදර දොර දරු පැටවුන් ගේ වැඩ. ඒ මදිවට ස්වාමි පුරුෂයා ගේ ඕනෑඑපා කම්. මේ ඔක්කොම තියෙද්දීත් වගා කටයුතුවල නිරතව පවුලට අමතර ආදායමක් උපයන ගෘහණියක් කුලියාපිටියේ මාහිංගොඩ ටී. බී. බේබිනෝනා මහත්මිය. ඇගේ ස්වාමිපුරුෂයා මෙසන් බාස්උන්නෙහැ කෙනෙක්. ඔවුන් සතු අක්කර දෙකක විතර පොල් ඉඩමක්

තිබෙන නමුත් පොල් ගස්වල සරු පාටක් නම් පෙන්වන්නෙ නැහැ. පෝර ටිකක්වත් ගස්වල වැටිල තිබෙන්නේ සහනාධාර ක්‍රමය අවාට පස්සේ. දැන් නම් පස සංර ක්‍ෂණ යට එහෙමත් ගෙනත් තිබෙනවා කෘෂිකර්ම සංවර්ධන අධිකාරියෙන් ගත්තු කොපි පැල 40 කුත් පොල් වගාව යටතේ ඉන්දල තිබෙනවා.



ටී. බී. බේබිනෝනා මිය

ඇය බුලත් වගාවට උපන් හපනියක්. ඉතා සරු සාර බුලත් පාත්ති හයක් ඇය විසින් නඩත්තු කරනවා. ඇය ලබන ආදායම මසකට රු. 200 ක් විතර. පොල් වගාව සම්බන්ධව පවතින නොයෙක් ගැටළු ගැන ඇය සඳහන් කළ කරුණු මෙසේ යි.

"බුලත් වැව්ල්ල ලොකුම බාධාව ප්‍රදේශයේ පවතින වෛරස් රෝගය. මේකට කිසිම පිළියමක් තවමත් කෘෂිකර්ම නිලධාරීන් අප හට දන්වලා නැහැ. මං හිතන්නේ ඒ අය ගේ අවධානය යොමු විය යුතු වැදගත්ම කරුණක්. දැන් මේ හින්ද වැල් අසලට මම ලමයෙකුටවත් යන්නට දෙන්නේ නැහැ. ඒ තරම් පරිස්සමින් හදන්නේ ඒත් බැරි වෙලාවත් වැලකට එම රෝගය බෝ උනොත් මම ඒ අසල වැල් සියල්ලම ගලවලා පුළුස්සා දමනවා."

"බුලත් වැව්ල්ලට ඉනි සපයා ගැනීම බුලත් වවන ගොවීන් හැමෝටම ප්‍රශ්නයක්ව පවතිනවා. ඉනි සපයා ගැනීම දැන් මේ පලාතේ ලෙහෙසියෙන් කරන්න බැහැ. එක ඉන්නක් ශත 50 ක් විතර වෙනවා. ඒත් සුදුසු ඉනි සොයා ගැනීම අපහසු කරුණක්."

"අනෙක් කරුණ මේ වගේ බුලත් වඩන තව සෑහෙන පිරිසක් මේ පළාතේ ඉන්නවා. ඔක්කොම දවස් 15 කට සැරයක් බුලත් කඩලා ගිහින් විකුණන්න පොලේ වෙළෙන් දන්ටයි. මිළ ගණන් නියම කරන්නේ ඔවුන් ම යි. රජයේ ආයතනයක් බුලත් මිළ දී ගැනීමට කටයුතු සලස්වනවා නම් මං හිතනවා අපට මීට වඩා ඉහළ මිලක් ලබා ගන්නට පුළුවන් බව."

බුලත් හදන එක ලෙහෙසි පහසු කාරියකුත් නොවෙයි. හැමදම බුලත් ඉනි තුනකට වතුර කළ ගෙඩි එකක් බැගින් එක පාත්තියකට වතුර කළ ගෙඩි 18 ක් පමණ පාත්ති හයකටම වතුර කළ ගෙඩි 100 විතර දිනපතා ඇය යොදනවා.